මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2020 මාර්තු

| සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I | 12 ශ්‍රේණිය | කාලය: පැය 02 යි |
|---|---|---|

උපදෙස්:
- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 50 තෙක් ප්‍රශ්නවලදී දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

---

(01) සන්නිවේදනය යනු පණිවිඩයක් ප්‍රතිනිර්මාණය කිරීමේ ක්‍රියාවක් යනුවෙන් අර්ථ නිරූපණය කළේ,

1. හැරල්ඩ් ලැස්වෙල් 2. විල්බර් ශ්‍රාම් 3. ෂැනොන් හා වීවර්
4. චාල්ස් කූලි 5. එඩ්වඩ් සැපීර්

(02) ලෝකයට ජනමාධ්‍ය බිහිකිරීමේ තීරණාත්මක ජයග්‍රහණයේ නියමුවා වන්නේ,

1. සායිලුන් 2. සැමුවෙල් මෝර්ස් 3. ජොහැන්නස් ගුටෙන්බර්ග්
4. තෝමස් අල්වා එඩිසන් 5. ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්

(03) සන්නිවේදනය පිළිබඳ පහත සඳහන් විග්‍රහයන් අතරින් සාවද්‍ය පිලිතුර තෝරන්න.

1. සන්නිවේදන කාර්යයට පුද්ගලයාගේ පංචේන්ද්‍රියම භාවිත කරයි.
2. මානවයා මෙන්ම සත්වයාද සන්නිවේදනයෙහි යෙදේ.
3. සන්නිවේදනය මානව සමාජයේ පැවැත්මට අනවශ්‍ය සාධකයකි.
4. සන්නිවේදනය මගින් අදහස් හා තොරතුරු හුවමාරුවක් සිදු වේ.
5. මානවයා සිතන්නට පටන් ගත් දිනයේ සිටම සන්නිවේදනය ආරම්භ වන්නට ඇත.

(04) සන්නිවේදනය ශාස්ත්‍රීය විෂයක් ලෙස අධ්‍යයනය කිරීම කෙරෙහි ලෝකයේ අවධානය යොමු වූයේ,

1. 20 වන සියවසේ මුල් භාගයේදී ය. 2. 21 වන සියවස ආරම්භයේදී ය.
3. 20 වන සියවසේ අග භාගයේදී ය. 4. ලෝක යුද්ධ සමයේදී ය.
5. 19 වන සියවසේ අග භාගයේදී ය.

(05) ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල පද්ධතියට ප්‍රථම වරට ජන සන්නිවේදන විෂය හඳුන්වා දුන්නේ කිනම් විශ්වවිද්‍යාලයෙන් ද?

1. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය 2. පේරාදෙණිය විශ්වවිද්‍යාලය
3. කැලණිය විශ්වවිද්‍යාලය 4. කොළඹ විශ්වවිද්‍යාලය
5. සබරගමුව විශ්වවිද්‍යාලය

(06) සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ඉගැන්වීම් ආරම්භ කළ පළමු විශ්වවිද්‍යාලය ලෙස හඳුන්වන්නේ,

1. පෙන්සිල්වේනියානු විශ්වවිද්‍යාලය 2. හාර්වඩ් විශ්වවිද්‍යාලය
3. ඉලිනොයිස් විශ්වවිද්‍යාලය 4. ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය
5. කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය

(07) ඉංග්‍රීසි බසින් රචිත ලිපියක් කියවමින් සිටි සුමාලි එහි වූ වචනයක අරුත ශබ්ද කෝෂය පෙරළමින් සොයා බලන අවස්ථාව,

1. ද්විමාර්ගික කාර්යයකි. 2. අර්ථකථනයකි. 3. පරිවර්තනයකි.
4. සංජානනයකි. 5. විකේතිකරණ තත්වයකි.

(08) සුනිල්ගේ මුහුණ දුටු අයට හැඟුනේ ඔහු අප්‍රසන්න හැඟීමකින් සිටින බවයි. මෙම සිද්ධිය සම්බන්ධ කළ හැක්කේ,

1. අන්තර්පුද්ගල සන්නිවේදනය සමඟයි.   2. අවාචික සන්නිවේදනය සමඟයි.
3. ද්විමාර්ගික සන්නිවේදනය සමඟයි.   4. සාම්ප්‍රදායික සන්නිවේදනය සමඟයි.
5. ස්වසංකල්ප සන්නිවේදනය සමඟයි.

(09) පුවත්පතක පළ වූ ඡායාරූපයේ පැත්තක කළු තීන්ත තැවරී තිබුණි. මෙම තත්ත්වයට අදාළ පිළිතුර තෝරන්න.

1. කාර්මික දෝෂයකි.   2. පාරිසරික ගැටලුවකි.
3. මුද්‍රණ දෝෂයකි.   4. අර්ථ බාධකයකි.   5. මාධ්‍ය බාධකයකි.

(10) ජනමාධ්‍ය තුළින් ප්‍රකාශයට පත් කරනු ලබන තොරතුරු පිළිබඳ අවසන් තීරණ ගනු ලබන්නේ,

1. ජනමාධ්‍යවේදීන් ය.   2. සංස්කාරකවරුන්ය.
3. නිසි බලධාරීන්ය.   4. මාධ්‍ය හිමිකරුවන්ය.   5. දොරටුපාලකයින් ය.

(11) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය සම්බන්ධව නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.

1. තීරණ ගැනීමට සම්බන්ධයක් නැත.   2. ස්වයං දෘෂ්ටියට අදාළ වේ.
3. පුද්ගල මතකයට සම්බන්ධ වේ.   4. සංජානනයන් අර්ථකථනය කිරීමට උපකාරී වේ.
5. ආත්ම භාෂණයට ප්‍රමුඛත්වයක් ලැබේ.

(12) කථන සන්නිවේදනය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. එය නිරායාසයෙන් සිදු වේ.   2. ස්වභාවික ක්‍රියාවලියකි.
3. ග්‍රාහකයා අනුව වචන තෝරාගත හැකිය.
4. නිර්වාචික සන්නිවේදනයෙන් උදව් ලබාගත නොහැකිය.
5. අන් අයට පහසුවෙන් අවබෝධ කර ගත හැකිය.

(13) හැරල්ඩ් ලැස්වෙල් සන්නිවේදන ආකෘතිය,

A - චක්‍රීය ගලායාමක් සහිතය
B - බලපෑම පිළිබඳ අවධානය වැඩිය.
C - මූලිකාංග පහක් ගෙනහැර දක්වයි.
D - ග්‍රාහකයා පිළිබඳ දක්වන සැලකිල්ල අඩුය.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,

1. A, B, C   2. A, C, D   3. B, C, D   4. A, C   5. B, C

(14) ජනමාධ්‍ය භාවිතයේදී සෙසු ඒවාට සාපේක්ෂව උදාසීන මාධ්‍ය යුගලය වන්නේ,

1. පුවත්පත් හා සඟරා   2. ගුවන්විදුලිය හා රූපවාහිනිය
3. සිනමාව හා නවමාධ්‍ය   4. පුවත්පත හා ගුවන්විදුලිය
5. සිනමාව හා රූපවාහිනිය

(15) ජනසන්නිවේදනයෙහි අනිවාර්ය සාධකයක් නොවන්නේ,

1. දොරටුපාල කාර්යය   2. තාක්ෂණික විධික්‍රම භාවිතය
3. පොදු සන්දේශ විසරණය   4. ද්විමාර්ගික බව
5. ධූරාවලියක් සහිත ආයතනික රටාව

(16) දොරටුපාල සංකල්පයට විරුද්ධ සාධකයක් වනුයේ,

1. මාධ්‍ය නිදහස   2. මාධ්‍ය නියාමනය   3. මාධ්‍ය සංස්කෘතිය
4. මාධ්‍ය හිමිකාරීත්වය   5. මාධ්‍ය අනුග්‍රාහකත්වය

(17) වර්තමාන සමාජය තොරතුරු සමාජයක් හා දැනුම පදනම් කරගත් සමාජයක් ලෙසට හැඳින්වීමට හේතුව පහත ඒවා අතරින් කුමක් ද?

1. අධ්‍යාපනය හා ජනමාධ්‍ය
2. සමාජ ඒකාබද්ධතාව
3. සංස්කෘතික ප්‍රගමනය
4. තොරතුරු සම්පාදනය
5. විනෝදාස්වාදය සැපයීම

(18) විද්‍යුත් සන්නිවේදන ක්‍රියාවලියකදී බාධකයක් නොවන්නේ,

1. අධික වර්ෂාව හා අකුණු ගැසීම.
2. මාධ්‍ය දැනුම නොමැති වීම.
3. ග්‍රාහකයාගේ දුර්වල සෞඛ්‍ය තත්වය
4. ආවරණ කලාපය තුළ සිටීම.
5. තරංග ක්‍රියාකාරීත්වය අවම වීම.

(19) පහත සඳහන් අදහස්වලින් රූපණය සම්බන්ධව නොගැළපෙනුයේ,

1. රූපණය ක්‍රියාකාරකමක් මෙන්ම වෘත්තියකටද අදාළ වේ.
2. රූපණය ඉරියව් හා හැසිරීම්වලින් බිහි වීම.
3. රූපණය නිසා භාෂාවේ අර්ථ තහවුරු වීම.
4. රූපණය පුද්ගල බද්ධ වීම.
5. රූපණය සංස්කෘතික විරෝධාකල්පයක් වීම.

(20) පුවත්පතක් සිය මාධ්‍ය පරිභෝජන වියදම අවම කිරීම සඳහා යොදා ගන්නේ,

1. අනුග්‍රාහකයන්
2. මාධ්‍ය දැන්වීම්
3. විශේෂාංග ලිපි
4. ග්‍රාහක ප්‍රතිචාර
5. ලාභදායී මුද්‍රණ තාක්ෂණය

(21) කිසියම් මාධ්‍යයක ලක්ෂණ පහත දැක්වේ.

A - හිමිකාරීත්වය අවිනිශ්චිතය
B - ග්‍රාහක අවශ්‍යතා මත පාලනය වේ.
C - අභිමතය පරිදි භාවිත කළ හැකිය.

ඉහත ලක්ෂණ දැකිය හැක්කේ,

1. ජනමාධ්‍යයේ ය.
2. විකල්ප මාධ්‍යයේ ය.
3. විධිමත් මාධ්‍යයේ ය.
4. පුරවැසි මාධ්‍යයේ ය.
5. අන්තර්ජාලයේ ය.

(22) රූපවාහිනී මාධ්‍ය, සමාජයෙහි වඩාත් ජනප්‍රිය මාධ්‍යය බව සමීක්ෂණ වාර්තා හෙළි කරයි. එසේ ජනප්‍රිය වීමට වඩාත්ම බලපාන වැඩසටහන් කාණ්ඩය තෝරන්න.

A - ප්‍රවෘත්ති
B - ටෙලිනාට්‍ය
C - Reality වැඩසටහන්
D - සංගීතමය වැඩසටහන්
E - ආගමික වැඩසටහන්
F - ජෝතිෂ වැඩසටහන්
G - ළමා වැඩසටහන්

1. A, B, C, D
2. A, B, E, F
3. B, C, F, G
4. B, C, D, E
5. C, D, F, G

(23) තොරතුරු විසරණය සඳහා යොදා ගත හැකි විධික්‍රම කිහිපයක් පහත දැක්වේ.

A - ස්ථාවර දුරකථන
B - ජංගම දුරකථන
C - සාමාන්‍ය තැපැල
D - විද්‍යුත් තැපැල
E - කෙටි පණිවිඩ

මේ අතුරින් පුද්ගලාන්තර සන්නිවේදනය සඳහා යොදා ගත හැක්කේ,

1. A හා B පමණි.
2. A, B හා D පමණි.
3. A, B, D හා E පමණි.
4. A, B, C හා D පමණි.
5. A, B, C, D හා E යන සියල්ලම.

(24) සන්නිවේදන ක්‍රියාවලියෙහි අන්තර්ගතය ලෙස සැලකෙන්නේ,

1. සන්දර්භයයි. 2. බලපෑමයි. 3. ග්‍රාහක ක්ෂේත්‍රයයි.
4. පණිවිඩයයි. 5. නාලිකාවයි.

(25) රූපවාහිනී වැඩසටහන් පිළිබඳ දර්ශක (Ratings) මූලික වශයෙන් පදනම් වන්නේ,

1. ප්‍රේක්ෂක සංඛ්‍යාව අනුව ය. 2. වැඩසටහනේ කාල ප්‍රමාණය අනුව ය.
3. ඊට සම්බන්ධ වූ නළු නිළි සංඛ්‍යාව අනුව ය. 4. වැඩසටහනේ වියදම අනුව ය.
5. වැඩසටහනේ අදායම අනුව ය.

- පහත සඳහන් වන්නේ ජනමාධ්‍යයේ කාර්යභාරය පිළිබඳ අදහස් ය.

A - සමාජ උරුමය අඛණ්ඩව ව්‍යාප්ත කිරීම.
B - සාකච්ඡා මණ්ඩපයක භූමිකාව
C - ගුරුවරයෙකුගේ භූමිකාව
D - පරිසරයට බලපාන සාමාජිකාංග සම්බන්ධ කිරීම.
E - ආරක්ෂකයෙකුගේ භූමිකාව
F - පරිසරය ආරක්ෂා කර ගැනීමට රුකුල් දීම.

(26) ඉහත අදහස් අතුරින් මහාචාර්ය විල්බර් ශ්‍රාම් ඉදිරිපත් කළ අදහස් අතරට අයත් වන්නේ,

1. A, B, C 2. C, D, E 3. E, B, C 4. F, A, B

(27) ආචාර්ය හැරල්ඩ් ඩී. ලැස්වෙල් ඉදිරිපත් කළ අදහස් ගොන්නට අයත් වන්නේ,

1. A, B, C 2. A, D, F 3. E, B, C 4. F, A, B 5. A, C, D

(28) ව්‍යාපාරික ප්‍රජාව සඳහා සුවිශේෂයෙන් නිර්මාණය කර ඇති වෙබ් අඩවියකි.

1. Instagram 2. Skype 3. Twitter 4. Linkedin 5. We chat

(29) තම රැකියා ස්ථානය පිළිබඳ කලකිරීමට පත්ව ඇති සුනිල් එදින නිවසට යන අතරතුර කල්පනා කළේ වෙනත් රැකියාවකට යාමටයි. මෙබඳු අවස්ථාවක දක්නට ලැබෙන්නේ,

1. අවිධිමත් සන්නිවේදනයයි. 2. අන්තර්වර්තී සන්නිවේදනයයි.
3. පුද්ගලාන්තර සන්නිවේදනයයි. 4. නිර්වාචික සන්නිවේදනයයි.
4. විධිමත් සන්නිවේදනයයි.

(30) ආකේතන ක්‍රියාවලියේ දී සන්නිවේදකයා වඩාත් අවධානයට යොමු කළ යුත්තේ,

1. ආකර්ෂණීය සංකේත භාවිතා කිරීමටයි. 2. නිර්මාණාත්මක සංකේත භාවිතා කිරීමටයි.
3. සන්නිවේදක කේන්ද්‍රීය සංකේත භාවිතා කිරීමටයි. 4. සම්මත සංකේත භාවිතා කිරීමටයි.
5. දෘශ්‍ය රූප බහුල සංකේත භාවිතා කිරීමටයි.

(31) ග්‍රාහකයා පිළිබඳ වඩාත් නිදොස් ප්‍රකාශය වන්නේ,

1. දෙදෙනෙකු නොමැති තැන ග්‍රාහකයෙකු නොසිටීමයි.
2. ග්‍රාහක භූමිකාව ස්ථාවරව පැවතීමයි.
3. ග්‍රාහකයාට සැමවිටම අර්ථකථනය කිරීමේ කුසලතාවය පැවතීමයි.
4. ග්‍රාහක සාක්ෂරතාව සම මට්ටමේ නොපැවතීමයි.
5. ග්‍රාහකයාගේ වින්දන ක්ෂේත්‍රය පුළුල්ව පැවතීමයි.

(32) ජනමාධ්‍යන්ගේ පැවැත්ම සඳහා මූලිකවම අවශ්‍ය වන්නේ කුමක්ද?

1. අදහස් 2. සංවිධාන 3. ආයතන 4. තොරතුරු 5. සාක්ෂරතාව

(33) පවුල, පාසල, ආගමික ස්ථාන තුළින් කුඩා කල සිට නිවැරදි ජීවන රටාවක් හුරු කිරීමේ කාර්යය,
1. සහානුභූතියයි 2. සමාජානුයෝජනයයි 3. ආගමානුකූල බවයි
4. හැදියාවයි 5. ස්ව පෞරුෂයයි.

(34) තොරතුරු ආකේතකරණය හා විකේතකරණය යන්න මුල්වරට හඳුන්වා දෙනු ලැබුවේ,
1. දේශපාලන දෘෂ්ටියෙන් ඉදිරිපත් කළ ආකෘතියෙනි.
2. ප්‍රතිපෝෂණය සහිත ද්විමාර්ගික ආකෘතියෙනි.
3. ගණිතානුකූලව ඉදිරිපත් කරන ලද ආකෘතියෙනි.
4. සාම්ප්‍රදායික සන්නිවේදනයේ වටිනාකම පැහැදිලි කළ ආකෘතියෙනි.
5. පොදු සන්දේශ විසරණය කරන ලද ආකෘතියෙනි.

(35) මුද්‍රණ කාර්යය සඳහා අවශ්‍යය මූලික සොයාගැනීම සිදුකළ රට කුමක්ද?
1. ඉන්දියාව 2. ඉරානය 3. ඇමරිකා එක්සත් ජනපදය
4. ජර්මනිය 5. චීනය

(36) සැකය හා කුතුහලය මත පදනම්ව ඉතා වේගයෙන් ව්‍යාප්ත විය හැකි සන්නිවේදන ස්වරූපයක් වන්නේ,
1. අන්තර් පුද්ගල සන්නිවේදනය. 2. විධිමත් සන්නිවේදනය.
3. අවිධිමත් සන්නිවේදනය. 4. අන්තර්වර්ති සන්නිවේදනය.
5. දෘෂ්‍ය සන්නිවේදනය.

(37) ''නිමල් හා කමල් මුණගැසුණු මොහොතේ කතා කරගත්තේ හෙට දින මිතුරන් එක්ව චාරිකාවක් යාමට වුවද ඥාතීන් පිරිසක් නිවසට පැමිණෙන බව දැන් වූ හෙයින් ඔවුන් මගහැර යන්නේ කෙසේදැයි සිත් විය.''
මෙහි දක්නට ලැබෙන සන්නිවේදන වර්ග අනුපිළිවෙළින් වැක්වෙන්නේ,
1. සමූහ සන්නිවේදනය හා අන්තර්වර්ති සන්නිවේදනය
2. අන්තර්වර්ති සන්නිවේදනය හා අන්තර්පුද්ගල සන්නිවේදනය
3. ජන සන්නිවේදනය හා අන්තර්පුද්ගල සන්නිවේදනය
4. සමූහ සන්නිවේදනය හා අන්තර්පුද්ගල සන්නිවේදනය
5. අන්තර්පුද්ගල සන්නිවේදනය හා අන්තර්වර්ති සන්නිවේදනය

(38) පහත දැක්වෙන කරුණු අතරින් අන්තර්ජාලය හා නූතන මාධ්‍ය අතර වෙනස්කම් අතරට අයත් නොවන පිළිතුර කුමක්ද?
1. හිමිකාරීත්වයේ නිශ්චිත බව 2. භූගෝලීය සීමාවන් අතික්‍රමණය කිරීම.
3. අනෙකුත් මාධ්‍යයන්ට සාපේක්ෂව වේගවත් වීම. 4. කල්ගත වූ නමුත් පරිශීලනය කිරීමේ හැකියාව
5. ග්‍රාහකයාට තම අවශ්‍යතාව මත මාධ්‍ය පාලනය කරගැනීමේ හැකියාව

(39) වෙස් මුහුණු නාටක නමින් ප්‍රකට ගැමි නාටක විශේෂය වනුයේ,
1. සොකරි 2. කෝලම් 3. නාඩගම් 4. රූකඩ 5. ජහුටා

(40) සාම්ප්‍රදායික මාධ්‍යන්හි සුවිශේෂී ලක්ෂණ අතරට අදාළ නොවන්නේ,
1. ජන මූල පදනම 2. පොදු පිළිගැනීම. 3. පොදු යහපත අරමුණු වීම.
4. සංස්කෘතික සන්දර්භයක් නොපැවතීම. 5. තේමාත්මක අන්තර්ගතය.

(41) සාමාන්‍ය ජීවිතයේදී පුද්ගලයෙකුගේ සන්නිවේදන ධාරිතාවෙන් වැඩි ප්‍රමාණයක් වැය වන්නේ,
1. ශ්‍රවණයට 2. කථනයට 3. පාඨනයට 4. ලේඛනයට 5. රූපණයට

- අංක 42 සිට 45 තෙක් ප්‍රශ්නවලට පහත දැක්වෙන සටහන ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| A - සන්නිවේදකයා | G - ශ්‍රාවකයා |
| B - සන්දේශය | H - නාලිය |
| C - කථිකයා | I - අවස්ථාව |
| D - බලපෑම | J - බාධක |
| E - කථාව | K - ප්‍රතිපෝෂණය |
| F - ග්‍රාහකයා | L - අග්‍රස්ථානය |

(42) ඉහත සටහන ඇසුරෙන් ඇරිස්ටෝටල් ආකෘතියට අදාළ අංග වන්නේ,

1. A, B, C, D හා I
2. D, E, F, G හා A
3. B, C, D, E හා F
4. C, E, G, I හා D
5. H, I, G, E හා C

(43) සන්නිවේදන ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය අංග අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර වනුයේ,

1. C, B, H, F
2. A, B, H, G
3. A, B, H, F
4. A, B, C, D
5. A, B, H, I

(44) A සිට F දක්වා පණිවුඩයක් ගලාගෙන යාමේදී එය අසම්පූර්ණ ලෙස F වෙත ලැබීමට බලපාන සාධකය වනුයේ,

1. D ය.
2. J ය.
3. I ය.
4. G ය.
5. A ය.

(45) කමල් නිමල්ට යැවූ කෙටි පණිවිඩයට එසැනින් නිමල්ගේ පිළිතුරු ලැබිණි. මෙම තත්ත්වය,

1. K වේ.
2. L වේ.
3. G වේ.
4. F වේ.
5. I වේ.

(46) ගෘහස්ථ සන්නිවේදනය සංස්කෘතිය පවත්වාගෙන යාමේදී අවම වැදගත්කමක් සහිත වන්නේ,

1. අන්තර්වර්තී සන්නිවේදන නිපුණතා
2. පුද්ගලාන්තර සන්නිවේදන නිපුණතා
3. ජනසන්නිවේදන නිපුණතා
4. අවාචික සන්නිවේදන නිපුණතා
5. සමූහ සන්නිවේදන නිපුණතා

(47) ශ්‍රී ලංකාවේ පළමු ලියාපදිංචි සිංහල පුවත්පත වනුයේ,

1. ලංකාලෝකය
2. ලක්මිණි පහන
3. සිංහල බෞද්ධයා
4. ලක්රිවි සිංහල බෞද්ධයා
5. මිණි පහන

(48) පරිකල්පනය ඉහළම මාධ්‍යයක් වන්නේ,

1. රූපවාහිනිය
2. ගුවන්විදුලිය
3. නව මාධ්‍ය
4. සාම්ප්‍රදායික මාධ්‍ය
5. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය

(49) ''පෙරදින පැවති විශාල දේශපාලන රැළියකට අපි සහභාගි වීමු.''
මෙය අයත් සන්නිවේදන ප්‍රභේදය කුමක්ද?

1. සමූහ සන්නිවේදනය
2. අතථ්‍ය සන්නිවේදනය
3. ශ්‍රව්‍ය - දෘශ්‍ය සන්නිවේදනය
4. මහජන සන්නිවේදනය
5. වාචික සන්නිවේදනය

(50) ''අධ්‍යක්ෂවරයාගේ කලාව'' යනුවෙන් හඳුන්වන ප්‍රබල කලා මාධ්‍යයක් වන සන්නිවේදන මාධ්‍ය වනුයේ මින් කුමක්ද?

1. සිනමාව
2. ටෙලිනාට්‍ය
3. රූපවාහිනිය
4. ගුවන් විදුලි නාට්‍ය
5. යථාකාරී වැඩසටහන්

## දෙවන වාර පරීක්ෂණය - 2020 මාර්තු

| සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II | 12 ශ්‍රේණිය | කාලය: පැය 03 යි. මි.10 |
| --- | --- | --- |

උපදෙස්: **ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

---

(01) සන්නිවේදන ක්‍රියාවලියේ වර්ධනයත් සමඟ අසීමාන්තික තොරතුරු ජනනය නිසා සමාජය කෙරෙහි එමගින් සිදුවන බලපෑම ප්‍රබලය

i. මාධ්‍යයේ අහිතකර බලපෑමෙන් ළමා හා තරුණ පරපුර මුදවා ගත යුතු බව දක්වමින් යුනෙස්කෝ සංවිධානය ප්‍රකාශයට පත් කළ ප්‍රකාශනය නම් කරන්න.

ii. පෙන්සිල්වේනියානු විශ්වවිද්‍යාලය මගින් ඉදිරිපත් කළ පර්යේෂණ වාර්තාවට අනුව රූපවාහිනියේ ප්‍රචණ්ඩ ක්‍රියා සහිත වැඩසටහන් නැරඹීම නිසා ළමුන් තුළ ඇතිවන වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

iii. සන්නිවේදන අධ්‍යයනය ක්ෂේත්‍රය පිළිබඳ ශාස්ත්‍රීය වශයෙන් අධ්‍යයනය කිරීමේ වැදගත්කම කරුණු 03 ක් ඇසුරින් පැහැදිලි කරන්න.

iv. ''ශාස්ත්‍රීය විෂයක් ලෙස සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය හා විකාශනය'' යන මැයෙන් පුවත්පතකට සුදුසු ලිපියක් ලියන්න.

(02) ''පුද්ගල හා සමාජ සම්බන්ධතාවන්ගේ පදනම සන්නිවේදනයයි.''

i. සන්නිවේදනය යන්න කෙටියෙන් අර්ථ දක්වන්න.

ii. සන්නිවේදනයේ ස්වභාවය කරුණු දෙකක් ඇසුරින් කෙටියෙන් පහදන්න.

iii. විධිමත් සන්නිවේදනය හා අවිධිමත් සන්නිවේදනය අතර වෙනස්කම් තුනක් පැහැදිලි කරන්න.

iv. ඔබ කැමති ජනමාධ්‍යයක් ඇසුරින් සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග 4 ක් විමර්ශනය කරන්න.

(03) i. සන්නිවේදනයේ චතුර්විධ කාර්යයන් නම් කරන්න.

ii. ආකේතිකරණය හා විකේතිකරණය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.

iii. වෙළෙඳ දැන්වීම් 2 ක් ඇසුරින් සන්නිවේදනයේ පෙළඹවීමේ කාර්යය පැහැදිලි කරන්න.

iv. ප්‍රධාන සන්නිවේදන බාධක වර්ග දෙක පුවත්පත් මාධ්‍යයෙහි දක්නට ලැබෙන ආකාරය උදාහරණ දෙක බැගින් ගෙන පැහැදිලි කරන්න.

(04) i. ජනමාධ්‍යයන්හි මූලික ප්‍රභේදයන් දෙක නම් කරන්න.

ii. එම මාධ්‍ය යොදා ගනිමින් පුද්ගලාන්තර සන්නිවේදනයේ යෙදිය හැකි ආකාර දෙකක් පැහැදිලි කරන්න.

iii. අතථ්‍ය සන්නිවේදනයේ ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න.

iv. සමූහ සන්නිවේදනය හා ජන සන්නිවේදනය අතර වෙනස මූලික සාධක හතරක් ඇසුරෙන් විස්තර කරන්න.

(05) සංකීර්ණ සන්නිවේදන ක්‍රියාවලිය රූපකාරකව දැක්වීම සන්නිවේදන ආකෘතිවලින් සිදු කෙරේ.

i. ඔබ දන්නා සන්නිවේදන ආකෘතිවලින් රේඛීය ආකෘතියක් හා රේඛීය නොවන ආකෘතියක් වෙන් වෙන්ව නම් කරන්න.

ii. ඔස්ගුඩ් සහ ශ්‍රාම් ඉදිරිපත් කළ ආකෘතියට අනුව විකේතිකරණය, ආකේතිකරණය බවට පත්වීමට හේතුවන සාධකය නම් කර එහි ඇති වැදගත්කම පිළිබඳව පැහැදිලි කරන්න.

iii. හැරල්ඩ් ලැස්වෙල්ගේ ආකෘතියේ දැකිය හැකි සුවිශේෂී මූලිකාංගය නම් කොට නිදසුනක් ඇසුරින් එය පැහැදිලි කරන්න.

iv. HUB ආකෘතියේ අංග හතරක් විස්තර කරන්න.

(06) වර්තමානයේ සාම්ප්‍රදායික මාධ්‍ය, ජනමාධ්‍යය, නව මාධ්‍ය ආදී සියල්ල මුසු කොට භාවිතා වන ආකාරය දැකිය හැකිය.

i. ඔබ දන්නා සාම්ප්‍රදායික සන්නිවේදන විධික්‍රම 04 ක් නම් කරන්න.

ii. ජනමාධ්‍යන්හි ලක්ෂණ 04 ක් නම්කොට එකක් පැහැදිලි කරන්න.

iii. සමාජ මාධ්‍ය භාවිතය තුළින් පාසල් ශිෂ්‍යයින් ලෙස ඔබට සිදුවිය හැකි හිතකර හා අහිතකර බලපෑම් දෙකක් සමාජමය නිදසුන් ඔස්සේ පහදන්න.

iv. සන්නිවේදනය සඳහා සාම්ප්‍රදායික විධි ක්‍රම භාවිතා කිරීමේ වැදගත්කම කරුණු හතරක් ඔස්සේ සාකච්ඡා කරන්න.

(07) i. ජනසන්නිවේදනයේදී සංදේශ ගලා යාම පාලනය කිරීමේ ක්‍රියාවලිය හැඳින්වෙන සංකල්පය නම් කරන්න.

ii. මංගල උත්සවයකදී දැකිය හැකි නිර්වාචික සන්නිවේදනය ප්‍රකට වන අවස්ථා 06 ක් නම් කොට ඉන් එකක් පැහැදිලි කරන්න.

iii. ව්‍යාපාරික කටයුතු සඳහා නව මාධ්‍ය භාවිතා කළ හැකි ආකාර දෙකක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

iv. රූපවාහිනී මාධ්‍ය හා සිනමා මාධ්‍ය අතර වෙනස්කම් කරුණු 4 ක් පදනම් කරගනිමින් විස්තර කරන්න.

# වාර පරීක්ෂණය - 2020 මාර්තු
## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

## ලකුණු දීමේ පටිපාටිය

### I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | 3 | (11) | 1 | (21) | 5 | (31) | 4 | (41) | 1 |
| (02) | 3 | (12) | 4 | (22) | 1 | (32) | 4 | (42) | 4 |
| (03) | 3 | (13) | 5 | (23) | 5 | (33) | 2 | (43) | 3 |
| (04) | 1 | (14) | 1 | (24) | 4 | (34) | 3 | (44) | 2 |
| (05) | 3 | (15) | 4 | (25) | 1 | (35) | 5 | (45) | 1 |
| (06) | 3 | (16) | 1 | (26) | 3 | (36) | 3 | (46) | 3 |
| (07) | 5 | (17) | 1 | (27) | 2 | (37) | 5 | (47) | 2 |
| (08) | 2 | (18) | 4 | (28) | 4 | (38) | 1 | (48) | 2 |
| (09) | 5 | (19) | 5 | (29) | 2 | (39) | 2 | (49) | 4 |
| (10) | 5 | (20) | 2 | (30) | 4 | (40) | 4 | (50) | 1 |

### II පත්‍රය

(01) i. 1982 ගෲස්වල්ට් ප්‍රකාශනය (ල. 02)

ii.
- වේදනාත්මක දේ පිළිබඳව සංවේදීතාව අඩුවීම.
- දරුවන් ඔවුන් ජීවත් වන පරිසරය හා අවට ලෝකය පිළිබඳ බියක් ඇතිකර ගැනීම.
- ආක්‍රමණශීලී බව වර්ධනය වීම. (ල. 2 x 2 = 4)

iii.
- ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් සන්නිවේදන ක්‍රියාදාමය හා මාධ්‍ය ක්‍රියාකාරීත්වය අවබෝධ කරගැනීම.
- විචාරශීලීව මාධ්‍ය පරිහරණය කිරීමේ කුසලතා වර්ධනය වීම.
- ගවේෂණශීලීභාවය, විචාරශීලී චින්තනය දියුණු වීම.
- මාධ්‍ය සාක්ෂරතාවය ඇතිවීම.
- නිර්මාණාත්මක චින්තනය වර්ධනය වීම. ආදී කරුණු විස්තර කිරීම (ල. 2 x 3 = 6)

iv. ගුරු මාර්ගෝපදේශයේ පාඩම - 01 ''සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය හා විකාශනය'' හි අන්තර්ගත කරුණු අනුව ලකුණු ලබාදෙන්න. (ල. 08)

(02) i. සන්නිවේදනය යනු තොරතුරු හුවමාරුවයි. (ඒ හා සමාන අදහස්වලට ලකුණු ලබා දෙන්න.) (ල. 02)

ii.
- සන්නිවේදනය අරමුණු සහගතයි.
- සන්නිවේදනය සංකේතාත්මකය.
- සන්නිවේදනය සන්දර්භානුගතය.
- ක්‍රියාපටිපාටියකි.
- විවිධාකාර වේ.
- බලය වේ.
- ඒකමාර්ගික මෙන්ම ද්විමාර්ගික වේ. (ල. 2 x 2 = 4)

iii.

| විධිමත් සන්නිවේදනය | අවිධිමත් සන්නිවේදනය |
|---|---|
| ◆ නිශ්චිත ස්ථානයක්/කාලයක්/වේලාවක් තුළ සිදුවීම. | ◆ නිශ්චිත ස්ථානයක්/කාලයක්/වේලාවක් දක්නට නොවීම |
| ◆ නිශ්චිත න්‍යාය පත්‍රයකට අනුව සිදු වීම. | ◆ නිශ්චිත න්‍යාය පත්‍රයක් දක්නට නොවීම. |
| ◆ තොරතුරු ගලා යාමේ විධිමත් ධාරාවන් පැවතීම. | ◆ තොරතුරු ගලා යාමේ විධිමත් රටාවක් නොමැති වීම. |
| ◆ තොරතුරු මූලාශ්‍ර පැහැදිලි වීම. | ◆ තොරතුරු මූලාශ්‍ර පැහැදිලි නොවීම. |
| ◆ සංදේශ වෙනස්කම්වලට / විකෘතිවීම්වලට ලක්වීමේ ඉඩකඩ අවම වීම. | ◆ සංදේශය වෙනස්කම්වලට / විකෘතිවීම්වලට ලක්වීමේ ඉඩකඩ වැඩි වීම. |
| ◆ සාපේක්ෂ වශයෙන් තොරතුරුවල විශ්වාසනීයත්වය ඉහළ වීම. | ◆ තොරතුරුවල විශ්වාසනීයත්වය අඩුවීම. |

(ල. 2 x 3 = 6)

iv. ◆ සන්නිවේදකයා/ආකේතිකරය ◆ පණිවුඩය / සංදේශය
◆ මාධ්‍ය / නාලිකාව ◆ ග්‍රාහකයා / විකේතිකරය
◆ ප්‍රතිපෝෂණය ◆ බාධක / ඝෝෂාව
◆ බලපෑම ◆ අත්දැකීම් පසුතලය
◆ සන්දර්භය
(තෝරාගත් ජනමාධ්‍යක් ඇසුරෙන් ඉහත මූලිකාංගවලින් 04 ක් විස්තර කර තිබිය යුතුය.) (ල. 2 x 4 = 8)

(03) i. ◆ තොරතුරු සම්පාදනය ◆ අධ්‍යාපනය ලබා දීම.
◆ පෙළඹවීම ◆ විනෝදාස්වාදය (ල. ½ x 4 = 2)

ii. ආකේතිකරණය - සිතේ ඇතිවන අදහස් සංකේතානුසාරයෙන් පණිවිඩයක් බවට පරිවර්තනය කර ගැනීම.
විකේතිකරණය - සංකේතානුසාරයෙන් ලැබෙන පණිවිඩය අවබෝධ කර ගැනීම. (ල. 2 x 2 = 4)

iii. කැමති වෙළඳ දැන්වීමක් ඇසුරෙන් පැහැදිලි කිරීම. (ල. 06)

iv.

| අර්ථ බාධා | මාධ්‍ය බාධා |
|---|---|
| ◆ විදග්ධ භාෂා භාවිතය<br>◆ ප්‍රාදේශීය ව්‍යවහාර භාවිතය<br>◆ වියරණ දෝෂ<br>◆ පාරිභාෂික වචන භාවිතය<br>◆ මිශ්‍ර භාෂා භාවිතය | ◆ මුද්‍රණ දෝෂ<br>◆ අක්ෂර බොඳවීම.<br>◆ තීන්ත තැවරීම<br>◆ වැරදි අක්ෂර මුද්‍රණය<br>◆ ඡායාරූප අපහැදිලි වීම |

(ල. 2 x 4 = 8)

(04) i. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය (ල. 02)

ii. ◆ විද්‍යුත් තැපෑල ◆ සමාජ ජාල ◆ Skyp
◆ Smart දුරකථන මගින් කෙටි පණිවිඩ ◆ Applications (viber, whatsapp....) (ල. 2 x 2 = 4)

iii. ◆ කාර්යක්ෂමව සන්නිවේදනයේ යෙදීමේ හැකියාව
◆ අඩු පිරිවැය
◆ ආරක්ෂිත බව
◆ ශ්‍රව්‍ය, දෘෂ්‍ය දර්ශන සහිතව සන්නිවේදනයේ යෙදීමේ හැකියාව
◆ එකවර පුද්ගලයින් රැසක් සමඟ සන්නිවේදනයේ යෙදීමේ හැකියාව
◆ භෞතික වශයෙන් ඉඩකඩ අවශ්‍ය නොවීම. (ල. 2 x 3 = 6)

iv.

| සමූහ සන්නිවේදනය | ජන සන්නිවේදනය |
|---|---|
| ◆ යන්ත්‍ර භාවිතය අනිවාර්ය නොවේ.<br>◆ වෘත්තීය මාධ්‍යවේදීන් නොමැත.<br>◆ සන්නිවේදන - ග්‍රාහක සබඳතා සෘජුය.<br>◆ පණිවුඩය පොදු හෝ පෞද්ගලික ස්වභාවයක් ගනී. | ◆ යන්ත්‍ර භාවිතය අනිවාර්ය වේ.<br>◆ වෘත්තීය මාධ්‍යකරුවන් සිටී.<br>◆ සබඳතා දුරස්ථ ය.<br>◆ පණිවුඩය පොදු ස්වභාවයක් ගනී. |

(ල. 2 x 4 = 8)

(05) i. රේඛීය - ලැස්වෙල්, ෂැනොන් වීවර් ආකෘති
රේඛීය නොවන - ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතිය (ල. 02)

ii. ◆ අර්ථකථනය/අර්ථ නිරූපණය / අර්ථ විවරණය
◆ පණිවිඩයක් තුළ පවතින අන්තර්ගත කරුණු මනාව පැහැදිලි කිරීම.
◆ සන්නිවේදනය අඛණ්ඩ ක්‍රියාවලියක් බවට පත් වීම.
◆ සන්නිවේදකයා ග්‍රාහකයා බවටත්, ග්‍රාහකයා සන්නිවේදකයා බවටත් පත්වීම.
◆ සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර පොදු මානසික තත්ත්වයක් ඇති වීම.
(නම් කිරීමට 2, පැහැදිලි කිරීමට 2 = 4)

iii. ◆ බලපෑම
සන්නිවේදකයා ග්‍රාහකයා වෙතින් අපේක්ෂා කරන ආකල්පමය හෝ චර්යාත්මක වෙනසකි.
(නම් කිරීමට 2, පැහැදිලි කිරීමට 2 = 4)

iv. ◆ සන්නිවේදකයෝ ◆ නියාමකයෝ ◆ සංඥා ◆ පෙරහනු
◆ දොරටු පාලකයෝ ◆ ග්‍රාහකයෝ ◆ ජනමාධ්‍ය ◆ බලපෑම් (ල. 2 x 4 = 8)

(06) i. ගැමි නාටක, ශාන්ති කර්ම, ජන කතා, ජන කවි ආදිය (ල. ½ x 4 = 2)

ii.
- ආයතනගත ක්‍රියාවලියක් සහිත වීම.
- පුළුල් ග්‍රාහක පිරිසක් සතු වීම.
- තාක්ෂණික මෙවලම් භාවිතා කිරීම.
- වෘත්තීයමය සන්නිවේදනය සිටීම. (නම් කිරීමට ½ x 4 = 2, විස්තර කිරීමට 2 = 4)

iii. ගැලපෙන නිදසුනකින් පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න (ල. 3 x 2 = 6)

iv.
- ගැනුම් ඉගෙනුම් සම්පාදනය
- උපදේශාත්මක සන්දේශ ජනනය කළහැකි වීම
- සංස්කෘතික අංග හුවමාරු කිරීමට හැකිවීම.
- භාව ප්‍රකාශනය
- අහිතකර සමාජ ප්‍රවනතා විවේචනයට ලක් කිරීම.
- විනෝදාස්වාදයට යොදා ගැනීම (ල. 2 x 4 = 8)

(07) i. දොරටුපාල සංකල්පය (ල. 2 )

ii.
- මුදු පැළඳවීම
- ඇඳුම් පැළඳුම්
- කිරිකඩ සේලය
- තැලිපිලි පැළඳවීම
- පුන් කලස්
- මංගල පෝරුව
- දෑගිලි ගැට ගැසීම
- බුලත් හුරුළු බිම දැමීම ආදිය

(නම් කිරීමට ½ x 6 = 3, විස්තර කිරීමට 1 = 4)

iii.
- භාණ්ඩ හා සේවා පිළිබඳ ප්‍රචාරය කිරීම
- අන්තර්ජාල වෙළඳාම
- සමාජ ජාල හරහා ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම.

ආදී අදාළ කරුණු (ල. 3 x 2 = 6)

iv.

| රූපවාහිනී මාධ්‍ය | සිනමා මාධ්‍ය |
|---|---|
| 1. විද්‍යුත් මාධ්‍යයකි. | 1. රසායනික/ඩිජිටල් මාධ්‍යයකි. |
| 2. සම්ප්‍රේෂණ මාධ්‍යයකි. | 2. ප්‍රක්ෂේපණ මාධ්‍යයකි. |
| 3. කුඩා තිරය/සාමාන්‍ය හඬ | 3. පුළුල් තිරය, තීව්‍ර හඬ |
| 4. ආලෝකය සමඟ මුසු වීම. | 4. අඳුර සමග මුසු වීම. |
| 5. වානිජමය/තොරතුරු මාධ්‍යයක් වීම | 5. ප්‍රබල කලා මාධ්‍යයක් වීම. |

(ල. 2 x 4 = 8)